




# අතුල ලෙව්කේ බණ්ඩාර!

පසුගිය දා මෙල්බර්න් නුවර පැවැත්වුණ කලා උත්සවයකදී ප්‍රවීන රංගන ශිල්පී ජය ශ්‍රී චන්ද්‍රජිත් ඉතා හෘදයාන්ගම ලෙස ගායන ශිල්පියෙකු ප්‍රේක්ෂකයින්ට හඳුන්වා දුන්නා.

"අපේ මව්බිමේ දීත් වෘත්තීය ගායන ශිල්පියෙකු වශයෙන් රසික ප්‍රසාදය දිනූ...... අතුල ලෙව්කේ බණ්ඩාර !"

කාලයක පටන් අතුල අප අතරම ගැවසෙමින් හැකි පමණින් ප්‍රසංග කටයුතුවලට ද දායක වෙමින් සිටිය ද අප ඔහුගේ රසිකයින් වූයේ මව්බිමේදී බව සිහිපත් වූයේ ඒ හැඳින්වීම නිසා-වෙනි.

අනූව දශකයේ අග භාගය වන විට එළිමහන් ප්‍රසංග වේදිකාවේ නිතර දක්නට ලැබුණු අතුල ලෙව්කේ වෙත බිම සිට අත්පොළසන් දුන් විශාල රසික ප්‍රේක්ෂකයින් අතර අපි ද වීමු. සැබැවින්ම මව් බිමේ දීත් ගායනයේ යෙදුණ ගායන ශිල්පියෙකු අප අතර මෙ රටෙහි සිටින්නේ ඔහු පමණක් නොවේ ද ?

"ගී සඳළුව" වෙනුවෙන් මෙවර අප අතුලව මුණගැසුණෝ කලක් තිස්සේ අත පසු වී ගිය යුතුකමක් ද ඉටු කිරීමේ සද් භාවයෙන් යුතුවයි. නිහඬව නිහතමානීව අප අතරේම ගැවසෙන ඔහු පිළිබඳව යමක් සටහන් කිරීම යුතුකමක් සේ හැඟෙයි.

"ඉතින් අතුල....?"

"හොඳයි, හොඳයි....!" අතුල සිනාසුනා.

"මොනවද ඉතින් වෙන්නෙ ඉස්සරහට.....?"

"ඒක තමයි මේ මාත් හිත හිතා ඉන්නේ. අතපහු වෙන දේවල් නම් ඕන තරම්. විවේකයක් නැතිකම තමයි ප්‍රශ්ණ."

"ඒ කිව්වෙ ?"

"ලංකාවෙදි අළුතින් කරපු ගී එකතුව සම්පූර්ණ වෙලයි තියෙන්නේ. ඒත් එළිදක්වන්න නම් මාස පහ හයකට එහේ යන්න වෙනවා. මොකද අපි එහේ ඉන්න එක ප්‍රචාරක කටයුතුවලට එහෙම ඒ අයට උදව්වක් වෙනවා. ඒත් ඉතින් ඔය තරම් මේ කරන රස්සාවෙන් නිවාඩු ගන්න එකනෙ ප්‍රශ්ණෙ."

"ඒ අය කියලා කිව්වෙ ?"

"මගේ අළුත් ගීත එකතුව කළේ "රන්සිළු එන්ටප්‍රයිසස්" ආයතනයෙන්. ඒ අය කියනවා මාධ්‍යවලට යන්න, ප්‍රසංගවලට සහභාගි වෙන් ශිල්පියා ඒ කාලෙට එහේ ඉන්නවානම් හොඳයි කියලා... බලමු මොකද වෙන්නෙ කියලා....." අතුලගේ සිනහව යටින් බලාපොරොත්තුවක රැල්ලක් නැගෙයි.

"අපි කැමතියි අතුලගේ සංගීත ජීවිතේ ගැන ටිකක් දැනගන්න..."

මගේ මව්ට හොඳට සින්දු කියන්න පුළුවන්. ඒ වගේම එයා සින්දු කියන්නෙ ඩොල්කියත් වාදනය කරන ගමන්. තාත්තට හොඳට "මවුත් ඕගන්" එක වාදනය කරන්න පුළුවන්. ලොකු මල්ලි පියානෝ, කී බෝඩ් (සර පුවරුව) එහෙම වාදනය කරනවා. අනික් මල්ලිලා දෙන්නෙක්ම බටහිර ආරයට ගීත ගායනා කරනවා..."

"මුළු පවුලම සංගීතවත් පවුලක් එහෙනං ?"

"ඔව් ඔව්. ඉතින් කට්ටියම එකතු වෙලා අපි ඉතින් ඒ කාලේ ඉඳන්ම සාජ්ජ පැවැත්තුවා ගෙදරම."

"මුලින් ම මම සංගීත කණ්ඩායමකට ගායකයෙක් විදියට බැඳුනෙ 1979. ඒ කාලෙ මම පාසල් ශිෂ්‍යයෙක්. පානදුරේ පැත්තෙයි ඒ කණ්ඩයාම තිබුණෙ. ඊට පස්සේ "ප්‍රෙස්කෝ" සංගීත කණ්ඩායමේ "රිදම්" ගිටාර් වාදකයෙක් විදියටත් " කී බෝඩ්" (සර පුවරු) වාදකයෙක් විදියටත් කටයුතු කළා. ඊට පස්සේ කාලෙක "ඩ්‍රීම්ස්" කණ්ඩායමේ "රිදම්" ගිටාර් එක වාදනය කළා. මල්ලි ඒ කණ්ඩායමේ "කීබෝඩ්" එක වාදනය කළා.

"පස්සෙ කාලෙක "සන්ෆ්ලවර්" කියලා හඳුන්වපු "ඇමේෂන් ග්‍රේෂන්" කණ්ඩායමට එන්න කියලා මට කතා කලේ නීල් වර්ණකුලසූරියයි.

"1981 දී කොළඹ හැව්ලොක් ටවුමේ ලුම්බිණි රඟහලේ මම " අතුල ගී සංකල්පනා" කියලා ප්‍රසංගයක් කළා." ඒ අවුරුද්දේදීම ඒ ප්‍රසංගයේ දෙවෙනි ප්‍රසංගය මහනුවර "අවන් හල" කියන තැන පැවැත්වූවා.

හද පෙළා ගිය දිනේ මා දවා
දුක දරා ඉන්නදෝ මා සදා
මනලෝලී මන රාජිනී
නොකියාම සැඟවී ගියා
චණ්ඩ මාරුතයේ පැටලී
බැන්ද ආදරේ ගිලිහී

ඔබ දුටු දා ළඳේ
මා සිතුවේ සදා
ඔබ රුව සේ හදත්
පිවිතුරු යැයි සිතා

තනිව මා ඉන්නම්
මා එපා වී නම්
දුක දරාගන්නම්
සැමදා මෙසේ මා
රැවටිලා රුවට මා නම් ඉතින්
ඔබ සොයා එන්නේ නෑ මා ඉතින්

ඔබ තෙපලූ කතා
ගිනි දැල් මා දවා
මට අවමන් කළා
වෙනතක ළං වෙලා

තනිව මා ඉන්නම්
ඔබ සිනා සේ නම්
දුක දරා ගන්නම්
හැම දා මෙසේ මා
රවටලා හදවතක් මේ තරම්
වේදනා දෙන්නෙපා ආයේනම්

*රචනය, තනු හා සංගීත නිර්මාණය, ගායනය :*
**අතුල ලෙව්කේ බණ්ඩාර**

අතුල ලෙව්කේගේ ගී බො-හෝමයක්ම රචනා කරගත්තේත තනු හා සංගීත නිර්මාණය කරගත්තේත් ඔහු විසින්මය. පද රචනාවත්, තනු හා සංගීත නිර්මාණයත්, ගායනත් යන ගීයක තෙවැදෑරුම් අංගයන්ම එක් ශිල්පියෙකුට හෝ නිර්මාණකරුවෙකුට කළ හැකි වේ නම් ඔහුම හෝ ඇය "වාග් ගේය කාර්" නමින් හැඳින්වෙයි.

"ඇත්තටම මෙම මුලින්ම නිර්මාණය කරගත්ත ගීතය වෙන ගායකයෙක් එයාගේ ගීත එකතුවකටත් ගායනා කළා. ඔය සිද්ධියෙන් මට පොඩි කලකිරීමක් ඇතිවුණා. ඒ ගී එකතුව කරපු නිශ්පාදකයා ඒ වෙනුවෙන් කණගාටු වෙලා මගේ ගී එකතුවක් කරන්න ආරධනා කළා. ඒත් අර කළකිරීම නිසා මම ඒක ප්‍රතික්ෂේප කරලා විදේශගත වුණා."

1987 දී මම ලංකාවට ආව වෙලේ "සාගර ෆැන්සි පැලස්" අයිති අර නිශ්පාදකයා ආයෙමත් ගීත එකතුවක් කරන්න කතා කළා. ඒ ගී එකතුව කරගෙන යන අතරේ ඔහුත් එක්ක කතා කරගෙන "සාරංගී එන්ටප්‍රයිසස්" අධිපති අනිල් ප්‍රශන්ත මහත්තයා ඒ ගී එකතුව මිළයට අරගෙන "ළං වී" කියලා කැසට් පටයක් නිකුත් කළා. ඇත්තට ම මම ඒ ගීත කළේ ආධුනිකයෙක් හැටියට."

"මගේ දෙවෙනි කැසට් පටිය තමයි" සඳ තාරකාවී". ඊට පස්සේ "රන්සිළු" එන්ටර්ප්‍රයිසස්" එක්ක "සඳ කිඳුරි" කැසට් පටිය කළා. ඒ කාලෙ තැටි තිබුණෙ නෑනේ."

හතරවෙනි කැසට් පටිය නොනවතින ගීත එකතුවක්. ඒ කියන්නේ "නන් ස්ටොප්" :හධභ "ඔධඡ* ගීත. ඒ කැසට් පටියේ නම "සිහින කුමාරි"

"රන්සිළු" එකෙන් ඒ දවස්වල තිබුණ ජනප්‍රිය සංගීත ප්‍රසංග පෙළක් සජීව්ව කැසට් පටිවලට ගත්තා. "සහරා සංගීත ප්‍රසංග 1, 2 කියලා කැසට් පෙළක්ම නිකුත් වුණා. මේවා වලත් මගේ ගායනා ඇතුලත්වුණා. ඒ වගේම "නිල්වලා" සමාගමෙන් ගායක ගායිකාවෝ 54 දෙනෙක් එකතු කරගෙන කරපු "නන් ස්ටොප්" ගී එකතුවටත් මගේ ගීතයක් ඇතුලත් වුණා. ඒකේ සංගීතය කළේ "සුපර් ස්ටාර්ස්" සංගීත කණ්ඩායම. ඊට පස්සෙයි " නිල්වලා" එකෙන් "සුපර් ස්ටාර්ස් සමඟ අතුල ලෙව්කේ බණ්ඩාර" කියන කැසට් පටය කළේ. ඒකට මගේ ගීත 18ක් ඇතුලත් වුණා."
අතුලගේ ගී වැඩි වශයෙන්ම ඔහුගේම නිර්මාණ වුවද ඇතැම් ගී පබැඳූ අසංග ආරියවංශ, හේමසිරි හල්පිට පද රචකයින් මෙන්ම අත දෙමින්, දිරි දෙමින් තනු කීපයක් නිර්මාණය කළ මහින්ද බණ්ඩාර ප්‍රවීණ ශිල්පියාණන්වද සිහිපත් කිරීමට ඔහු අමතක නොකළේය.

"මේ කැසට් පටි කළේ ඒ සමාගම් එක්ක ගිවිසුම්වලට අත්සන් කරලයි. අළුත්ම ගීත එකතුව "රන්සිළු" කළේත් එහෙමයි. "සිරස" ගුවන් විදුලියෙන් කරන " කඩමණ්ඩිය" වැඩ සටහනටත් ගිවිසුම් අත්සන් කරලයි තිබුණෙ. වැඩ සටහන් දෙකකට විතර සහභාගි වුණා." ඒත් දරුවන්ගේ අනාගතය, ආරක්ෂාව ගැන හිතලා මෙහේ එන්න තීරණය කළා.

"කඩමණ්ඩිය" යනු සිරස ගුවන් විදුලිය පළාතෙන් පළාතට ගොස් සංවිධානය කළ ප්‍රසංග පෙළකි. කෙසේ වුව ද අතුල ලෙව්කේ බණ්ඩාර "ඉල්ලුමක්" ඇතිව සිටින ගායන ශිල්පියෙකු බව අපි ද දැන සිටියෙමු. ඒ බව ඔහුගේ ඉහත අතීතාවර්ජනයෙන් ද පෙනී යයි. මෙල්බර්න් නුවරදී වුව ඔහු මයික්‍රපෝනය අතට ගත් කල ගැයීමට බලාපොරොත්තුව ආ ගීත ගණනට වඩා ගී ගැයීමට නිතරම සිදුවන්නේ රසික ඉල්ලීම් නිසාවෙනි.

කලකට ඉහත එළිමහන් වේදිකා ප්‍රසංග අබියස අත්පොළසන් දෙමින් බලා හුන් අප වැනි රසිකයින් හට නිවේදකවරුන් අතුල හඳුන්වා දුන් අයුරු දැණුදු සිහිපත් වේ.

"මෙන්න පිළිගන්න, ඔබේ ආදරණීය ගායක අතුල ලෙව්කේ, අතුල ලෙව්කේබණ්ඩාර !!"

**Do you need**
Your Own Sri Lankan Accountant With

>> Personalized Advice at Any Time
>> Pre Agreed Fixed Fee & No More Surprises
>> Always Close to Your Business Physically and in Mind

"We will take care of you"



**Over 10 Years Experienced Service For**

> Individual and Business Tax Returns
> GST & BAS
> Bookkeeping Services (MYOB and QuickBook)
> Business Start Up Solutions (Incorporations & System Design)
> Software Training
> Small Business Advice and Training

**Amali Liyanage**
"Advance Tax & Business Consultant"
M.Com.B.Sc.ASA,
**Registered Tax Agent**

**M : 0433 732 854**
e : advanceab@gmail.com
1/98, Plumpton Av
Glenroy - 3046

SAAMART.COM.AU